Annexure II

FOR OFFICE USE ONLY

Account No			…… Manager
Branch			
Product Code			
CIF No.			…… Date
Entered by	PF	Sig.	
Authorized by	PF	Sig.	

කළමනාකරු
ලංකාබැංකුව

……

කරුණාකර පහත සපයා ඇති විස්තර ප්‍රකාර බාලවයස්කරුගේ නමින් රන් කැකුළු ගිණුමක් අරඹන්න.

☐	**දේශීය මුදල්**		**රන් කැකුළු SMART** **වෙනත් ……**	☐	**විදේශීය මුදල්**		**PFC බාලවයස්කාර**		**PFC බාලවයස්කාර ස්ථාවර තැන්පතු**
						☐ USD	☐ GBP	☐ EUR	☐ AUD ☐ JPY ☐ ----------

බාලවයස්කරු පිළිබඳ පෞද්ගලික විස්තර (ගිණුම්හිමියාගේ)			
සම්පූර්ණ නම (උප්පැන්නසහතිකයේ පරිදි)	මයා/මෙනෙවිය/පූජ්‍ය		
මුලකුරු සමග නම		ස්ත්‍රී/පුරුෂභාවය	පුරුෂ ☐ ස්ත්‍රී ☐
උපන් දිනය (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න)	දි දි මා මා අ අ අ අ	උප්පැන්න සහතික අංකය.	
පාසලේ/පෙරපාසලේ නම (අදාළ නම්)		පාසල් කේතය (අදාළනම්)	
ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍ර අංකය (තිබේ නම්)- ඡායා පිටපතක් අමුණන්න		ජාතිය පදිංචිය ☐ ශ්‍රී ලංකාව ☐ වෙනත් (නිශ්චිතව දක්වන්න)	
ස්ථිර ලිපිනය		තැපැල් ලිපිනය (ස්ථිර ලිපිනයෙන් වෙනස් වන්නේ නම්)	
ඇමතුම් විස්තර	ජංගම දු.අංකය විද්‍යුත් තැපෑල	නිවෙස	
ගිණුම අරඹන මව/පියා/භාරකරුගේ පෞද්ගලික තොරතුරු			
සම්පූර්ණ නම	මහතා/මිය/මෙනෙවිය/පූජ්‍ය		
බාල වයස්කරුට ඇති ඥාතිත්වය		ජාතිය	
ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍ර අංකය-ඡායා පිටපතක් අමුණන්න		උපන් දිනය	දි දි මා මා අ අ අ අ
ලිපිනය (දේශීය)		රැකියාව/ ව්‍යාපාරය	
ඇමතුම් විස්තර	ජංගම දු.අංකය විද්‍යුත් තැපෑල	නිවස	
විදේශ ගිණුම් සඳහා පමණි			
විදේශ ලිපිනය		සේවායෝජකයාගේ නම හා ලිපිනය	
දු.ක අංකය (විදේශීය)		තැපැල් ලිපිනය	☐ ශ්‍රී ලංකාව ☐ විදේශීය
වෙනත්තොරතුරු			
ගිණුම ඇරඹීමේ හා භාවිතයේ අරමුණු	☐ ඉතිරිකිරීම් ☐ ප්‍රේෂණ ☐ පවුල/පුද්ගලනඩත්තුව ☐ වෙනත් (නිශ්චිතව දක්වන්න) _____		
අරමුදල් මූලාශ්‍ර	☐ විකුණුම් සහ ව්‍යාපාර පිරිවැටුප ☐ වැටුප්/ලාභ ආදායම ☐ පවුලේ ප්‍රේෂණ ☐ ආයෝජන ආදායම ☐ අනෙකුත් (සඳහන් කරන්න)		
මාසිකව අපේක්ෂිත ලැබීම් ප්‍රමාණය (ලංකා රුපියල් වලින්)	☐ 99,999 ට වඩා අඩු ☐ 100,000 – 499,999 ☐ 500,000 – 999,999 ☐ 1,000,000 – 1,999,999 ☐ 2,000,000 – 2,999,999 ☐ 3,000,000 – 5,000.000 ☐ 5,000,000ට වැඩි		
අපේක්ෂිත ගනුදෙනු ක්‍රමය	☐ මුදල් ☐ චෙක්පත් ☐ අරමුදල් පැවරුම් ☐ ආමුඛ ප්‍රේෂණ		

FATCA ප්‍රකාශය		
ඇමෙරිකා එක්සත් ජනපදයේ විදේශ ගිණුම් බදු අනුකූලතා පනත (FATCA) යටතේ ඔබ ඇ.එ.ජ. පුරවැසියෙක්ද?	බාලවයස්කරු (ගිණුම්හිමිකරු) ඔව් ☐ නැත ☐	මව/පියා/භාරකරු ☐ ඔව් ☐ නැත
ඔව් නම් මෙම අයදුම්පත සමග FATCA ප්‍රකාශය ඉදිරිපත් කළ යුතුය.		

විද්‍යුත් කාඩ්පත (දේශීය මුදල් ඉතිරිකිරීමේ ගිණුම් සඳහා පමණි) අවශ්‍ය නම්	
විද්‍යුත් කාඩ්පත අවශ්‍යයි ☐ ඔව් ☐ නැත	☐ නම රහිත ක්ෂණික කාඩ්පත ☐ නම සහිත කාඩ්පත
කාඩ්පතෙහි මුද්‍රණය කළ යුතු බාලවයස්කරුගේ නම	

ස්ථාවර නියෝග උපදෙස් (රන් කැකුළු SMART Investment ගිණුම් සඳහා අනිවාර්ය වේ)	
ගිණුම විවෘත කරන මව/පියා/භාරකරුගේ මුලකුරු සමග නම	

කරුණාකර, මාගේ/අපගේ අංක ..... දරන ලංකා බැංකුවේ ..... ශාඛාවේ පවත්වාගෙන යන ඉතිරිකිරීමේ/ජංගම/වෙනත් ..... ගිණුමෙන් (ගිණුම බාලවයස්කාරුගේ පියා/මව/භාරකරුගේ නමින් පවත්වාගෙන යා යුතුය) සතිපතා/මාසිකව/කාර්තුමය/අර්ධ වාර්ෂික/වාර්ෂිකව* රු./ඇ.ඩො/..... (මුදල) හරකොට බාලවයස්කරුගේ ගිණුමට ..... දින සිට ..... දක්වා/නැවත දැනුම් දෙන තුරු බැර කරන්න. (අනවශ්‍ය වචන කපා හරින්න)

ස්ථාවර නියෝග උපදෙස් සඳහා අදාළ වන නියමයන් සහ කොන්දේසි

1 ස්ථාවර නියෝග හර කිරීමට උපදෙස් දී ඇති ගිණුමෙන් ඉදිරිපත් කරනු ලබන චෙක්පත් හෝ එළඹ ඇති දැනට පවත්නා වෙනත් යම් ක්‍රියා පිළිවෙතක් මත මෙම ගෙවුම් ඇණවුමෙහි ප්‍රමුඛතාවය තීරණය කිරීමේ අයිතිය බැංකුව සතුය.

2 මරණය, බංකොලොත්බව, ඈවර කිරීම, අවලංගු කිරීම නොසලකා එම මරණය, බංකොලොත්බව, ඈවර කිරීම, අවලංගු කිරීම බැංකුවට දැනුම්දෙන තුරු මෙම නියෝගය වලංගුව පවතී.

3 ඕනෑම සංශෝධනයක් හෝ අවලංගු කිරීමක් ඊළග අනුයාත ගෙවීම් සිදු කළ යුතු දිනයට අවම වශයෙන් සතියකට පෙර බැංකුවට ලැබිය යුතුය.

රන් කැකුළු SMART/ රන් කැකුළු SMART Investment/PFC බාලවයස්කාර/අනෙකුත් ..... (නම සඳහන් කරන්න) ගිණුම් විවෘත කරන මව/පියා/භාරකරු විසින් කරනු ලබන ප්‍රකාශය (** අනවශ්‍ය වචන කපා හරින්න)

ඉහත සඳහන් නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවීම අයකරගත යුතු සෑම දිනයකම කරුණාකර මාගේ/අපගේ ජංගම/ඉතිරිකිරීමේ ගිණුම හර කරන්න. වරදක් අඩුපාඩුවක් හෝ ප්‍රමාදයක් හේතුවෙන් ඇතිවිය හැකි යම් අඩුපාඩුවක් සඳහා ලංකා බැංකුව වගකීමට බැඳී නැති බවත් මාගේ/අපගේ ගිණුමෙහි අරමුදල් නොමැති නම් ස්ථාවර නියෝගය අවලංගු කළ හැකි බවත් මම/අපි අවබෝධ කරගෙන සිටිමි/සිටිමු. නියමයන් හා කොන්දේසි වලින් බැඳී සිටීමට මම/අපි එකග වෙමි/වෙමු.

....

අත්සන 1 (බාලවයස්කාර ගිණුම විවෘත කරන මව/පියා/භාරකරුගේ අත්සන) අත්සන 2

(සටහන - බද්ධ ගිණුම් අවස්ථාවකදී සියලුම පාර්ශව විසින් ස්ථාවර නියෝග උපදෙස් අත්සන් කළ යුතුය)

ගිණුම අඛණ්ඩව පවත්වාගෙන යාමට පමණක් නාමනය කිරීම

ඉහත නම් සඳහන් බාලවයස්කරු වයස අවුරුදු 18 සම්පූර්ණ වීමට පෙර මගේ මරණය සිදුවුවහොත් ගිණුම අඛණ්ඩව පවත්වාගෙන යාමට මම පහත සඳහන් අය මෙයින් නම් කරමි.

නාමිකයාගේ සම්පූර්ණ නම	මහතා/මිය/මෙනෙවිය		
ලිපිනය			
ජා.හැ. අංකය		බාලවයස්කරුට ඇති නෑකම	
මව/පියා/භාරකරුගේ අත්සන		දිනය	

ස්ථාවර තැන්පතු (විදේශීය මුදල් ගිණුම් සඳහා පමණි)

(** අනවශ්‍ය වචන කපා හරින්න)

මුදල (ඉලක්කම් වලින්) ..... මුදල් වර්ගය ..... මුදල (අකුරෙන්) .....

කාලය ..... සිට *මාස/අවුරුදු ..... පොලී අනුපාතය වසරකට .....

..... දින සිට දැනට පවත්නා පොලී අනුපාතය යටතේ උපචිත පොලිය සමග මාස/වසර ..... ක කාලසීමාවක් සඳහා ස්වයංක්‍රීයව නැවත අලුත් කිරීමක් සිදු කිරීමට ලංකා බැංකුවට බලය දෙනු ලැබේ.

....

මව/පියා/භාරකරුගේ අත්සන දිනය

Office use only: **ලඳුපත් අංකය** | | | | | | | | |

ශ්‍රී ලංකා මහ බැංකුව - විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් සඳහා ඉල්ලුම්කරු විසින් සිදු කරනු ලබන ප්‍රකාශය

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත,

..... හි පදිංචි ..... වන මම මෙම පෝරමය මත මා විසින් සපයා ඇති සියලු විස්තර සත්‍යය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. විදේශ විනිමය මගින් ගනුදෙනු කිරීම සඳහා විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් පිළිබඳ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි ප්‍රතිපාදන යටතෙහි පනවා ඇති කොන්දේසි පිළිබඳව මා දන්නා බවත් එකී කොන්දේසි වලින් බැඳී සිටීමට මම එකඟ වන බවට මම මෙයින් පොරොන්දු වෙමි. එම පනතෙහි අරමුණු සඳහා ලංකා බැංකුවට අවශ්‍යයම විය හැකි මා හට නිකුත් කර ඇති කාඩ්පත මත විදේශ විනිමයෙන් මා විසින් සිදු කරනු ලබන ගනුදෙනු පිළිබඳව ඕනෑම තොරතුරක් සැපයීමට මම තවදුරටත් එකඟ වෙමි. මා වෙත නිකුත් කර ඇති විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් මත අනවසර ගනුදෙනු සිදු කරනු ලබන බවට සැක කිරීමට සාධාරණ හේතු වෙතොත් EFTC මත විදේශ විනිමය ලබා ගැනීම අත්හිටුවා එම කරුණ අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමට බලයලත් වෙළෙන්දාහට (බැංකුවට) සිදු වන බව මම දනිමි. එමෙන්ම මම සංක්‍රමණය වුවහොත්/ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාව හැර ගියහොත් අදාළ පදිරි රන් කැකුළු ස්මාර්ට් කාඩ්පත ලංකා බැංකුවට බාරදීමට මා පොරොන්දු වන බවද මම සහතික කරමි.

....

අයදුම්කරුගේ අත්සන දිනය

I, as the Authorized Officer have carefully examined the information together with relevant documents given by the applicant and satisfied with the bona-fide of these information and documents. I undertake to exercise due diligence on the transactions carried out by the card holder on her/his EFTC in foreign exchange and to suspend the availability of foreign exchange on the EFTC if reasonable grounds exist to suspect that unauthorized foreign exchange transactions are being carried out on the EFTC in violation of the undertaking and to bring the matter to the notice of the Director-Department of Foreign exchange.

…… ……..

Signature of the Authorized Officer Date

ගිණුම්හිමියා/මව/පියා/භාරකරු විසින් කරනු ලබන ප්‍රකාශය

මෙම ගිණුම පාලනය වන කොන්දේසි හා නියමයන් කියවා අවබෝධ කරගත් බවටත් එම කොන්දේසි හා නියමයන් වලින් බැඳී සිටීමට එකඟ වන බවටත් මම ප්‍රකාශ කරමි. මා/බාලවයස්කරු ඇ.එ.ජනපදයේ විදේශ ගිණුම් බදු අනුකූලතා පනත (FATCA) යටතේ ඇ.එ.ජනපද පුරවැසියකු වුවහොත් එකී කරුණ බැංකුවට වහාම දැන්වීමට මම පොරොන්දු වෙමි.

…… ……..

අයදුම්කරුගේ අත්සන (මව/පියා/භාරකරු හෝ අවු. 16-18 බාලවයස්කරු) දිනය:

ලද බව පිළිගැනීම

පහත සඳහන් දෑ ලද බව මම මෙයින් පිළිගනිමි:

පාස්පොත (අවශ්‍ය නම්) ☐ ඔව් ☐ නැත පාස් පොත්අංක: | | | | | | | | | |

එම්බොස් නොකළ කාඩ්පත (අවශ්‍ය නම්) ☐ ඔව් ☐ නැත කාඩ්පත් අංකය | | | | | | | | | | | | | | | | |

ගිණුමට අදාළ නියමයන් සහ කොන්දේසි ☐ ඔව් ☐ නැත

……

අයදුම්කරුගේ අත්සන (මව/පියා/භාරකරු හෝ අවු. 16-18 බාලවයස්කරු) දිනය ……

For office Use: System Updation Check List

☐ Sanction screening for account opening father/mother/guardian

☐ Source of funds verified

☐ Ran Kekulu SMART card request processed for Embossed Card

☐ Smart Passbook activation

රන් කැකුළු SMART ඉතිරිකිරීමේ/රන් කැකුළු SMART Investment/PFC බාලවයස්කාර/ PFC බාලවයස්කාර ස්ථාවර තැන්පතු ගිණුමට අදාළ නියමයන් හා කොන්දේසි

පොදු

1. රන් කැකුළු SMART ඉතිරිකිරීම්/ Investment/PFC බාලවයස්කාර/ PFC බාලවයස්කාර ස්ථාවර තැන්පතු ගිණුම තනි පුද්ගල ගිණුමක් විය යුතු අතර බද්ධ ගිණුමක් නොවිය යුතුය.
2. ගිණුම බාලයස්කරුගේ නමින් ඇරඹිය යුතුය.
3. වයස අවු. 16-18 අතර බාලවයස්කරුවෙකුට තමා වෙනුවෙන් ගිණුමක් ඇරඹිය හැක. වයස අවු. 16 ට අඩු බාලවයස්කරුවෙකු වෙනුවෙන් මව/පියා/භාරකරු විසින් ගිණුම ආරම්භ කළ යුතුය. රන් කැකුළු SMART Investment ගිණුම වයස අවුරුදු 15 සහ ඊට අඩු බාලවයස්කරුවන් සඳහා දෙමාපිය/බාරකරු විසින් විවෘත කළ යුතුය.
4. ගිණුම් හිමියාට වයස වසර 18 ක් සපිරුණු කල මෙම ගිණුම් කාණ්ඩ වලට අදාළයෝග්‍යතා නිර්ණායක සපුරාලීමට ගිණුම්හිමියාට ඇති හැකියාව මත පදනම්ව මෙම ඉතිරිකිරීමේ ගිණුම යොවුන් ඉතිරිකිරීමේ ගිණුමක්/ PFC ගිණුමක් බවට පරිවර්තනය කෙරේ. ගිණුම සක්‍රීය කිරීම සඳහා ගිණුම්හිමියා විසින් අත්සන් කරන ලද නව මැන්ඩේට්පතක් ඉදිරිපත් කළ යුතුය.
5. ඕනෑම පුද්ගලයකුට රන් කැකුළු SMART ගිණුම් සඳහා තැන්පතු සිදු කළ හැක.
6. මුදල් ආපසු ලබාගැනීම සඳහා උප්පැන්න සහතිකය/ජාතික හැඳුනුම්පත/විදෙස් ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.
7. බාලවයස්කරුවෙකුට වයස අවු. 18 සපිරෙන තෙක් කිසිදු මුදල් ආපසු ලබා ගැනීමකට/ගිණුම වසා දැමීමකට අවසර නොලැබේ. කෙසේ වෙතත් බාලවයස්කරුගේ සුබසිද්ධියට අදාළ අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාරවැනි අරමුණු හෝ හේතු වෙනුවෙන් බැංකුවේ තනි අභිමතය මත මුදල් ආපසු ගැනීමට/ගිණුම වසා දැමීමට අවසර දෙනු ලැබේ.
8. ගිණුම්හිමියාගේ මරණය සිදුවුවහොත් ශ්‍රී ලංකාවේ නීති වලට අනුව ගිණුමේ ශේෂය ගිණුම්හිමියාගේ නීත්‍යානුකූල හිමිකරුවන්ට ගෙවනු ලැබේ.
9. ආරම්භක තැන්පතුව, අවම ශේෂය, පොලී අනුපාතය සහ පොලිය ගණනය කිරීමේ සහ බැර කිරීමේ ක්‍රමවේදයන් බැංකුව විසින් කලින් කලට පවතින නීතිරීති අනුව වෙනස් කරනු ලැබිය හැකිය.
10. ගිණුම පවත්වාගෙන යාම වෙනුවෙන් සහ සපයන සේවාවන් සම්බන්ධ ගාස්තු සහ අයකර ගැනීම් බැංකුව විසින් කලින් කලට ප්‍රකාශයට පත් කරනු ලබන මිල ගණන් යටතේ අය කරනු ඇත. එකී ගාස්තු, අයකර ගැනීම් සහ මෙම ගිණුමට අදාළ වන රජය විසින් පනවනු ලබන බදු අවශ්‍ය විට ගිණුමෙන් හර කරනු ලැබේ.
11. මෙම ගිණුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදී ඇති උපදෙස් හා නියාමන අවශ්‍යතා ප්‍රකාරව පාලනය වන අතර වරින් වර සංශෝධනය වන ශ්‍රී ලංකාවේ පවත්නා නීති වලින්ද පාලනය වේ.
12. ගිණුම්හිමියාගේ/ගිණුම්හිමියාගේ දෙමව්පියන්ගේ හෝ භාරකරුගේ ලිපිනයේ/පෞද්ගලික තොරතුරු වල කිසියම් වෙනසක් සිදු කිරීම සඳහා බැංකුවට ලිඛිතව වහාම උපදෙස් ලබාදිය යුතුය. බැංකුව විසින් ගිණුම සම්බන්ධ තොරතුරු ගිණුම විවෘත කරන මව/පියා/භාරකරු විසින් බැංකුවට ලබාදී ඇති ලිපිනයට හෝ දුරකතන අංක හෝ වෙනත් සම්බන්ධ කර ගැනීමේ තොරතුරු ඔස්සේ සන්නිවේදනය කළ හැක. ගිණුම විවෘත කරන මව/පියා/භාරකරු විසින් සම්බන්ධතා තොරතුරු වල වෙනස් වීමක් සම්බන්ධයෙන් බැංකුවට දැනුම්දීමට අපොහොසත් වීම හේතුවෙන් තෙවන පාර්ශවයකට ගිණුම් තොරතුරු හෙළි වීම සම්බන්ධයෙන් බැංකුව වගකීමට ලක් නොවේ.
13. ගනුදෙනුකරුට නොදන්වා නීත්‍යානුකූල/නියාමන හේතුමත ගිණුමේ ඕනෑම ගනුදෙනුවක් සීමා කිරීමට බැංකුවට බලය ඇත.
14. ගිණුමේ විශේෂාංග, ගාස්තු, අනෙකුත් අයකිරීම් පිළිබඳව වෙනස්වීම්, සංශෝධනය කිරීම්, නැවැත්වීම හෝ අලුතෙන් එකතු කිරීම් පිළිබඳව බැංකුව විසින් සාධාරණ කාලයකට පෙර බැංකුවේ නිල වෙබ් අඩවිය හරහා හෝ ජනමාධ්‍ය ඔස්සේ හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන පුද්ගලික දැනුම්දීම් ක්‍රමයක් ඔස්සේ හෝ දැනුම්දෙනු ලැබේ. තවද ගිණුමට අදාළ වන පොලී අනුපාත සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය පිළිබඳ තොරතුරු බැංකුවේ නිල වෙබ් අඩවිය ඔස්සේ පළ කරනු ලැබේ.

රන් කැකුළු SMART ඉතිරිකිරීමේ ගිණුම/Investment ගිණුම

1. රන් කැකුළු SMART දේශීය මුදල් ගිණුම සඳහා ප්‍රදානය කරනු ලබන රක්ෂණ ප්‍රතිලාභ ගිණුම්හිමියාට වයස අවුරුදු 18 පිරෙන තුරු වලංගු වේ.
2. මෙම ඉතිරිකිරීමේ ගිණුමට සම්බන්ධ තිලිණ ප්‍රදානය කිරීම් සහ/හෝ වෙනත් විශේෂ ප්‍රතිලාභ ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමේ/ඊට අතිරේක සැපයීමේ හෝ වෙනස් කිරීමේ හෝ අත්හිටුවීමේ හිමිකම බැංකුවට ඇත. එවන් වෙනස් කිරීම් බැංකුවේ වෙබ් අඩවියෙහි/ශාඛා පරිශ්‍රයෙහිදී ප්‍රදර්ශනය කරනු ඇත.
3. ගිණුම සඳහා වන විශේෂ ප්‍රතිලාභ (උදා. රක්ෂණ,තිලිණ ප්‍රදානය,ශිෂ්‍යත්ව ආදිය) ලබා ගනු පිණිස බැංකුව විසින් වරින් වර තීරණය කරනු ලබන ගිණුම් ශේෂය/තැන්පතු/වසස් සීමාව ආදිය ගිණුම්හිමියා විසින් සපුරාලිය යුතුය.
4. කෙටිපණිවුඩ හෝSMART පාස්පොත හෝ බැංකුව විසින් සපයනු ලබන වෙනත් පහසුකමක් උපයෝගී කර ගැනීමේදී බැංකුවට සිදු වන හෝ දරා ගැනීමට සිදු විය හැකි යම් පාඩුවකට, ගාස්තුවකට, හිමිකම් ඉල්ලීමකට, වියදමකට හෝ හානියකට එරෙහිව බැංකුව හානි වලින් තොරව රැක ගැනීමේ වගකීම අවලංගු කළ නොහැකි ආකාරයට මව/පියා/භාරකරු විසින් දැරිය යුතුය.
5. බැංකුව විසින් සපයන ලද කෙටි පණිවුඩ/ SMART පාස්පොත/වෙනත් යම් පහසුකමක් භාවිතය මගින් පහත සඳහන් හේතු වලින් කිසිවක් නිසා හෝ වෙනත් කරුණක් නිසා ඇතිවන, විදින්නට හෝ දරන්නට සිදුවන යම්කිසි පාඩුවක්, හානියක්, ගෙවීමක් හෝ වියදමක් සඳහා බැංකුව කිසිදු ආකාරයකින් වගනොකියයි/වගකීමකට බැඳී නොසිටියි.

අ.) ජංගම දුරකතන අංකය වෙනස්වීම දැන්වීමට අපොහොසත්වීම.
ආ.) තෙවන පාර්ශවයකට රහස්‍ය අංකය/මුරපදය හෙළි කිරීම.
ඇ.) බැංකුවට වැරදි ජංගම දුරකතන අංකයක් සැපයීම.
ඈ.) සේවාව/ජංගම දුරකතන සේවාව නිසි අයුරින් ක්‍රියාත්මක නොවීම/ක්‍රියා නොකිරීම/බාධාවීම.

රන් කැකුළු SMART Investment ගිණුම

1. රන් කැකුළු SMART Investment ගිණුමක් විවෘත කිරීම සඳහා ස්ථාවර නියෝගයක් අනිවාර්ය වේ. බාලවයස්කාර අවුරුදු 18 වන තුරු ස්ථාවර නියෝගය පැවතිය යුතුය.
2. ස්ථාවර නියෝගය හර කරන ගිණුමෙහි අරමුදල් නොමැති වීම නිසා ස්ථාවර නියෝග අබණ්ඩව වාර 3 ක් ක්‍රියාත්මක නොවීමෙන් පවතින සාමාන්‍ය ක්‍රියා පිළිවෙත අනුව අවලංගු වීම සිදුවේ.
3. ස්ථාවර නියෝගයක් නොමැති ගිණුම් (ස්ථාවර නියෝගයක් ක්‍රියාත්මක නොකිරීම නිසා හෝ අරමුදල් නොමැති වීම නිසා අවලංගු වීම නිසා හෝ) අක්‍රමවත් ගිණුම් ලෙස සලකා රන් කැකුළු SMART Investment යටතේ ගිණුම පැවැත්වීම අත්හිටුවනු ලැබේ. එවැනි ගිණුම් සාමාන්‍ය රන් කැකුළු SMART ඉතිරිකිරීමේ ගිණුම් ලෙස සලකනු ලැබේ.
4. හිඟ ස්ථාවර නියෝග මුදල තැන්පත් කර නව ස්ථාවර නියෝගයක් ක්‍රියාත්මක කළ හොත් ගිණුම රන් කැකුළු SMART Investment ගිණුමක් බවට නැවත පරිවර්තනය කළ හැකිය.

PFC බාලවයස්කාර ඉතිරිකිරීමේ/ස්ථාවර තැන්පතු ගිණුම්

1. විදේශීය මුදල් ගිණුම සඳහා මව/පියා/භාරකරුගේ විදේශීය ආදායම පිළිබඳව සාක්ෂි බැංකුවට ඉදිරිපත් කළ යුතුය.
2. විදේශීය මුදල් ගිණුම් වලට සිදු කරන තැන්පතු අණකර, SWIFTS විද්‍යුත් අරමුදල් පැවරුම් හෝ PFC ගිණුමෙන් මුදල් පැවරීමක් ලෙස පරිවර්තනය කරගත හැකි විදේශීය මුදල් වලින් විය යුතුය.
3. PFC බාලවයස්කාර ළමා ඉතිරිකිරීමේ යෝජනා ක්‍රමය සඳහා ප්‍රදානය කරනු ලබන රක්ෂණ ප්‍රතිලාභ අඛණ්ඩව පවත්වාගෙන යන්නේද එසේ නැතහොත් අත්හිටවන්නේද යන්න බැංකුව තම තනි අභිමතය අනුව තීරණය කරනු ඇත.

රන් කැකුළු SMART ඉතිරිකිරීමේ ගිණුම් සඳහා නිකුත් කරනු ලබන විද්‍යුත් කාඩ්පත

1. රන් කැකුළු SMARTවිද්‍යුත් කාඩ්පත සියලු කල්හි ලංකා බැංකුවේ දේපලක් ලෙස පවතින අතර බැංකුවේ ඉල්ලීම මත කොන්දේසි විරහිතව හා වහාම බැංකුවට ආපසු බාරදිය යුතුය.
2. මෙම කාඩ්පත පැවරිය නොහැකි අතර එය භාවිත කිරීමට අවසර දෙනු ලබන්නේ ගිණුම්හිමියාට හෝ ගිණුම්හිමියාගේ මවට/පියාට/භාරකරුට පමණි.
3. ශේෂය විමසීම, මුදල් තැන්පතු සහ රන් කැකුළු SMART ගිණුමෙහි කෙටි බැංකු ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා මෙම කාඩ්පත ලංකා බැංකු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සමග පමණක් භාවිතයට අවසර ලබාදෙන අතර වෙන්ත කිසිදු අරමුණක් සඳහා භාවිතා නොකළ යුතුය.
4. මෙම කාඩ්පත භාවිතයෙන් ATM සහ CRMයන්ත්‍ර වලින් මුදල් ආපසු ලබා ගැනීම සීමා කර ඇති අතර වෙළෙඳසැල් වල (POS) ගනුදෙනු සහ විද්‍යුත් වාණිජ්‍යය (e-commerce) ගනුදෙනු සිදු කිරීමට අවසර දෙනු නොලැබේ.
5. ගිණුම්හිමියා හෝ ගිණුම ආරම්භ කරන ලද ගිණුම්හිමියාගේ මව/පියා/භාරකරු රහස්‍ය අංකය (PIN) ඉතා රහසිගත ලෙස තබාගත යුතු අතර කිසිදු අවස්ථාවකදී හෝ කිසිදු තත්වයක් යටතේ එය කිසිම පුද්ගලයකුට හෙළි නොකිරීමට පොරොන්දු විය යුතුය.
6. රන් කැකුළු SMART කාඩ්පත වලංගු වන්නේ එම කාඩ්පතෙහි සඳහන් කාලසීමාව සඳහා පමණි. කාඩ්පත නැතිවුවහොත්, සොරාගනු ලැබුවහොත්, එයට හානි වුවහොත් හෝ කල් ඉකුත්වුවහොත් ගිණුම්හිමියා හෝ ගිණුම්හිමියාගේ ගිණුම ආරම්භ කරන ලද මව/පියා/භාරකරු විසින් නව කාඩ්පතක් ලබාගත යුතුය.
7. කාඩ්පත් පහසුකම ගිණුම්හිමියාට වයස අවු. 18සපිරෙන තුරු හෝ ගිණුම්හිමියාගේ ගිණුම ආරම්භ කරන ලද මව/පියා/භාරකරු විසින් එම පහසුකම අහෝසි කරන ලෙස ඉල්ලීමක් කරන තුරු අඛණ්ඩව පවතී.
8. ගිණුම්හිමිකරු හෝ ගිණුම්හිමිකරුගේ මව/පියා/භාරකරු රන් කැකුළු SMART කාඩ්පත භාවිතයෙන් සිදු කරනු ලබන හෝ ක්‍රියාත්මක කරන සියලු ගනුදෙනු පිළිබඳව එම ගනුදෙනු කවරාකාරයෙන් සිදුකළද පූර්ණ වගකීම හරගත යුතුය.
9. මෙම කාඩ්පත උපයෝගී කර ගැනීම රන් කැකුළු SMART කාඩ්පතින් ආවරණය වන හෝ වෙනත් ආකාරයේ සියලු සේවා, පහසුකම් සහ ගනුදෙනු පාලනය වන බැංකුවේ දැනට පවත්නා රීති රෙගුලාසි සහ නියමයන් හා කොන්දේසි වලට යටත්වේ.
10. මෙම රන් කැකුළු SMART කාඩ්පත කිසිදු පූර්ව දැන්වීමකින් තොරව හෝ ගිණුම්හිමියාට හෝ ගිණුම්හිමියාගේ මව/පියා/භාරකරුට කිසිදු හේතුවක් නොදක්වා අවලංගු කිරීමේ, ආපසු ලබා ගැනීමේ හෝ අලුත් කිරීමේ පූර්ණ අභිමතය බැංකුව සතුය.
11. මෙම කාඩ්පත් පහසුකම අවසන් කිරීමට/අවලංගු කිරීමට ගිණුම්හිමියා හෝ ගිණුම්හිමියාගේ මව/පියා/භාරකරු විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.
12. රන් කැකුළු SMART කාඩ්පතෙහි සියලු ආදේශන සහ යළි අලුත් කිරීම් දැනට බලාත්මකව පවතින නියමයන් හා කොන්දේසි වලට යටත්වේ.
13. රන් කැකුළු SMART කාඩ්පත භාවිතයෙන් සිදු කෙරෙන සියලු ගනුදෙනු පිළිබඳ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශ ගිණුම්හිමියා හෝ ගිණුම්හිමියාගේ මව/පියා/භාරකරු විසින් නිවැරදි බවට පිළිගත යුතුය.
14. රන් කැකුළු SMART කාඩ්පත සොරාගනු ලැබුවහොත්, නැතිවුවහොත් ගිණුම ආරම්භ කළ මව/පියා/භාරකරු වයස අවු. 16-18 අතර බාලවයස්කරු වහාම ඒ පිළිබඳව බැංකුව දැනුම්වත් කළ යුතු අතර ලිඛිත තහවුරුවක්ද බැංකුවට ලබාදිය යුතුය. නැතිවූ/සොරාගනු ලැබූ හෝ ගිණුම ආරම්භ කළ මව/පියා/භාරකරු වයස අවු 16-18 අතර බාලවයස්කරුගේ කැමැත්තෙන් තොරව රන් කැකුළු SMART කාඩ්පත භාවිතයෙන් සිදු වන යම් පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව විසින් වගකීම දරනු නොලැබේ.